# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல் ஆணைக்குழு


පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : FE/101/2025<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2025.05. 08<br>திகதி |

**පළාත් ආණ්ඩුකාරවරු,**
**පළාත් ප්‍රධාන ලේකම්වරු,**

**<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06</u>**

පසුගිය වසරේ පැවති ජනාධිපතිවරණයේ හා පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරි සඳහා සහභාගී වූ විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ගේ මැතිවරණ දීමනා ඔවුන් වෙත ලබාදීම බොහෝ ප්‍රමාද වූ අතර ඒ සම්බන්ධයෙන් දැඩි විවේචනයන්ට ලක්වීමට ද සිදුවිය.

02. එබැවින් මා විසින් නිකුත් කර ඇති 2025.05.08 දිනැති චක්‍රලේඛ අංක LAE/2025-76 හි 3.1 ඡේදයේ උපදෙස් පරිදි පළාත් සභා අක්මුදල්වලින් ගෙවීම් කර මැතිවරණ කොමිෂන් සභාව වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර ගැනීම තුලින් මැතිවරණයට සහභාගී වූ නිලධාරීන්ට ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීමට හැකියාවක් පවතින බැවින් ඊට අවශ්‍ය අක්මුදල් කඩිනමින් අදාල පළාත් සභා ආයතනයට ලබාදීමට අවශ්‍ය කටයුතු සලසන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව

පිටපත්:- 01. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - අවශ්‍ය කටයුතු සඳහා
02. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් - අවශ්‍ය කටයුතු සඳහා


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:**011-2885207**
ෆැක්ස්/தொலைநகல் :**011-2885208**
***e-mail: cge@elections.gov.lk***

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர
දුරකථන/தொலைபேசி : 011-2866521
ෆැක්ස්/தொலைநகல் : 011-2866521
*e-mail : aroshanagamlath@gmail.com*


D:\Hansi\1. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම\CFO Sir\2025\2025.05.05 - 1.docx

චක්‍රලේඛ අංක:- LAE/2025-76

මගේ අංකය :- FE/101/2025
මැතිවරණ මහලේකම් කාර්යාලය.
සරණ මාවත,
රාජගිරිය.
2025.05. 08

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ දිස්ත්‍රික් ලේකම්වරු,
පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරීවරු,

**<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06</u>**
**<u>මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්</u>**

2025.05.06 දින පැවැත් වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී මැතිවරණ රාජකාරිවල නිරත වූ කාර්ය මණ්ඩලයට ගෙවිය හැකි ගාස්තු ප්‍රමාණ හා එම ගෙවීම්වලට අදාළ ගිණුම් කාර්ය පරිපාටිය පහත සඳහන් කර ඇත.

**02.** මැතිවරණ රාජකාරි සඳහා ගෙවීම් කිරීමට පෙර මෙම චක්‍රලේඛයේ ඇතුළත් කරුණු මැනවින් අධ්‍යයනය කර ගෙවීම් කරන ලෙස ඔබගේ ගිණුම් කාර්ය මණ්ඩලයට උපදෙස් දිය යුතුය. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස්වලින් පරිබාහිරව සිදුකරනු ලබන ගෙවීම් ප්‍රතිපූර්ණය නො කරන අතර එවැනි ගෙවීම් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ගෙවීම් කරන නිලධරයා විසින් භාරගත යුතුය.

**03.** මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් කළයුතු ස්ථාන හා එම ස්ථානවලින් සිදුකළ යුතු ගෙවීම් පහත පරිදි කාණ්ඩ දෙකකට වර්ගීකරණය කර ඇත. ගෙවීම් කරන නිලධරයා විසින් එම ස්ථාන හා ගෙවීම් පැහැදිලිව හැඳුනාගෙන, ඒ අනුව ගෙවීම් කළ යුතුය.

**03.1 තම ස්ථිර සේවා ස්ථානයෙන් කරනු ලබන ගෙවීම්**

(අ) දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් මත පහත සඳහන් කාර්යයන්හි නිරත වූ රජයේ කාර්යාල/ ආයතනවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට හා අනියුක්ත සහායකයන්ට මෙම චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස්වලට අනුව තම ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවීම් කළ යුතුය. ඉහත ගෙවීම් කිරීමේදී මැතිවරණ රාජකාරි සඳහා වියමත් පරිදි නිකුත් කරන ලද පත්වීමේ ලිපිය හා රාජකාරි ඉටුකළ බවට පැමිණීමේ සහතිකයක් ගෙවීම් වවුචරයට අමුණා තිබිය යුතුය.

i. කොට්ඨාශ භාර සහකාර තේරීම්භාර නිලධරයකු වශයෙන් හෝ ඡන්ද ප්‍රදේශ/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ සම්බන්ධීකරණ කාර්යාලයක සහකාර තේරීම්භාර නිලධරයකු වශයෙන් කටයුතු කිරීම.

ii. ඡන්ද පොලක හෝ ඡන්ද ප්‍රදේශ/ ප්‍රාදේශීය ලේකම් කාර්යල මට්ටමින් පිහිටුවනු ලැබූ සම්බන්ධීකරණ කාර්යාලයක (ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ලිපිකරුවකු හෝ කාර්යාල කාර්ය සහායකයකු වශයෙන්) කටයුතු කිරීම.

iii. ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ ශාලාවක දී ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි ආදිය නිකුත් කිරීමේ හා ආපසු භාර ගැනීමේ කාර්යයන්වල නිරත වීම.

iv. ඡන්ද ගණන් කිරීමේ ශාලාවක ගණන් කිරීමේ කටයුතු කිරීම හා ප්‍රතිඵල වගුගත කිරීම, ප්‍රතිඵල සකස් කිරීම හා ප්‍රකාශ කිරීමේ ශාලාවක ප්‍රතිඵල වගුගත කිරීමේ හා ප්‍රකාශ කිරීමේ කටයුතුවල නිරත වීම.

(ආ) ගෙවීමට අවශ්‍ය අක්මුදල් ලබා ගැනීම

❖ මධ්‍යම රජයේ ආයතන

ITMIS පද්ධතිය හරහා අක්මුදල් අයදුම් කරන ආයතන ITMIS පද්ධතිය වෙත ඇතුලත් කරනු ලබන සහතික කරන ලද අත්තිකාරම් වවුචරයක් මඟින් හා ITMIS පද්ධතිය හරහා අක්මුදල් අයදුම් නොකරන ආයතන සිය සාමාන්‍ය ක්‍රමවේදය යටතේ භාණ්ඩාගාරයෙන් අවශ්‍ය අක්මුදල් ලබාගෙන ගෙවීම් කිරීමට කටයුතු කළයුතුය.

❖ පළාත් සභා හා ඊට අයත් ආයතන

පළාත් භාණ්ඩාගාරයෙන් අවශ්‍ය අක්මුදල් ලබාගෙන ගෙවීම් කළයුතුය.

❖ සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ආයතන

ආයතනය සතු අරමුදල් මඟින් ගෙවීම් කළයුතුය.

(ඇ) ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම

ඉහත පරිදි ගෙවීම් කිරීමෙන් පසු ගෙවීම් පිළිබඳ විස්තර මෙම චක්‍රලේඛයේ 10.1 හා 10.2 අනුඡේදවල සඳහන් උපලේඛන සමඟ ඉහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

අදාල උපලේඛන ලද පසු පහත සඳහන් පරිදි පියවීමට කටයුතු කරනු ලැබේ.

| | | |
|---|---|---|
| i. මධ්‍යම රජයේ ආයතන | - | මේ සඳහා ප්‍රතිපාදන ලබා දෙනු ලබන අතර ප්‍රතිපාදන ලද වහාම භාණ්ඩාගාරයෙන් මැතිවරණ ගෙවීම් සඳහා ලබාගත් සියලු අක්මුදල් වෙනුවෙන් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| ii. පළාත් සභා හා ඊට අයත් ආයතන | - | අදාල මුදල් Sri Lanka Inter Bank Payment System (SLIPS) මඟින් අදාල ආයතනයේ බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලබන අතර වහාම පළාත් භාණ්ඩාගාරය වෙත අක්මුදල් පියවීම කළ යුතුය. |
| iii. සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ආයතන | - | අදාල මුදල් Sri Lanka Inter Bank Payment System (SLIPS) මඟින් අදාල ආයතනයේ බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 03.2 දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් සිදුකරන ගෙවීම්

පහත සඳහන් කාර්යයන්වල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ඔවුන්ට හිමි දීමනා ගෙවනු ලැබේ.

I. පත්වීම් ලිපි/ ලිපිගොනු භාර ගැනීමට කලින් දිනයක පැමිණීම වෙනුවෙන් ගෙවීම.

II. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් මත මූලික කටයුතුවල නිරත වීම.

III. සුභසාධන/ ප්‍රවාහන/ ශාලා සකස් කිරීම/ පොදු පහසුකම්/ සම්බන්ධීකරණ කමිටු වැනි ඒවායේ සේවය කිරීම.

IV. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඡන්දපොල කාර්යය මණ්ඩල සංචිත පවත්වාගෙන යාමේ කටයුතු කිරීමේ කාර්යය මණ්ඩලයට දීමනා ගෙවීම.

V. සේවා අපේක්ෂාවෙන් රැඳී සිටීම (පොරොත්තු සේවා)

VI. තේරීම්භාර නිලධාරි කාර්යාල/ මැතිවරණ කාර්යාලවලින් පමණක් ගෙවිය යුතු යැයි විශේෂයෙන් සඳහන් කර ඇති ගෙවීම්.

VII. ඡන්දපොල වෙත වාහන රැගෙන ගිය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ හා එම වාහන රියදුරන්ගේ දීමනා ගෙවීම.

VIII. ඉහත 03 ඡේදයේ 03.1(අ) අනුඡේදය යටතේ නිශ්චිතව සඳහන් නොවූ වෙනත් මැතිවරණ රාජකාරී සඳහා වූ ගෙවීම්.

ඉහත 03 ඡේදයේ 03.2 අනුඡේදයේ සඳහන් (I) සිට (VIII) දක්වා යටතේ වූ කාර්යයන්හි සේවයේ නියුතු ස්ථිර කාර්ය මණ්ඩලය හා සේවකයින් අදාළ තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් පරිදි අදාළ වවුචර් සහ උපකාරක ලියවිලි හැකි ඉක්මණින් තමන් සේවය කළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.

## 04. ගමන් වියදම් හා සංයුක්ත දීමනා

මැතිවරණ රාජකාරී සඳහා පත්කිරීමේ ලිපියකින් හා පත්කළ කාර්යය ඉටුකළ බවට පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඉහත 03 ඡේදයේ සඳහන් මැතිවරණ රාජකාරී සඳහා පහත දැක්වෙන විශේෂ අවස්ථා ද ඇතුළත්ව ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයෙහි දැක්වෙන පරිදි ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට නිලධාරීන්ට හිමිකම ඇත.

4.1 සහකාර තේරීම්භාර නිලධරයකු, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ඡන්ද පොල ලිපිකරුවෙකු හෝ කාර්යාල කාර්ය සහායකයකු වශයෙන් තෝරාගෙන ඇති කවර හෝ නිලධරයකු රාජකාරී සඳහා යාමට ගමන ආරම්භ කරන ස්ථානය ලෙස සැලකිය යුත්තේ නිලධරයාගේ සේවා ස්ථානයයි. <u>ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු කැටුව යන රජයේ සේවකයකු නො වන කාර්යාල කාර්ය සහායකයකුගේ කල්පිත සේවා ස්ථානය ලෙස සැලකිය යුත්තේ ද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ සේවා ස්ථානයයි.</u>

4.2 නිලධරයා තමන් පදිංචි නිවසෙහි සිට ගමන ආරම්භ කරන්නේ නම් හා එම නිවස ඔහුගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 24 ක් ඇතුළත පිහිටා ඇත්නම් පමණක් ඔහුට එම නිවසෙහි සිට ගමන ආරම්භ කිරීම සඳහා ගෙවීම් කළ හැකිය.

4.3 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත කල් ඇතිව වාර්තා කරන ලෙස උපදෙස් ලබාදී ඇති නිලධාරීන්ට තාවකාලික නවාතැන් ස්ථාන සපයා ඇත. එම ස්ථානවල නො රැඳී වෙනත් ස්ථානයක නවාතැන් ගෙන ඇත්නම් එවැනි නිලධාරියකුට ගමන් ගාස්තු ගෙවිය හැක්කේ නවාතැන් ගැනීමට නියම කළ ස්ථානයේ සිට උපරිම වශයෙන් කිලෝමීටර් 07 ක දුරක් සඳහා පමණකි.

4.4 I. මැතිවරණ රාජකාරී සඳහා හදිසි කැඳවීමක් නිසා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකට කෙටි කාලයකින් වාර්තා කිරීමට සිදුවූයේ නම් එවැනි අවස්ථාවක දී නිලධරයකුට වායුසමනය කළ බස්රථයකින් ගමන යාමට සිදුවිය හැකිය. එවැනි අවස්ථාවක දී ගමන සඳහා බස්රථයෙන් නිකුත් කළ ප්‍රවේශ පත්‍රය ගමන් වියදම් වවුචරයට අමුණා ඉදිරිපත් කළේ නම් වායුසමනය කළ බස් රථයට ගෙවූ ගාස්තුව ලබාදිය හැකිය.

II. සැතපුම් කුලී හිමි ක්ෂේත්‍ර නිලධරයකුට මැතිවරණ රාජකාරී සඳහා යතුරුපැදිය පාවිච්චි කිරීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි තමන් සේවය කළ දිස්ත්‍රික්කය තුළ පමණක් කිලෝමීටරයකට රු. 2.00 බැගින් සැතපුම් කුලී ගෙවිය හැකි අතර මැතිවරණ රාජකාරී සඳහා තමාගේ යතුරුපැදිය පාවිච්චි කළ බව තහවුරු කෙරෙන ලියවිල්ලක් තමන් සේවය කළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලබාගෙන ගමන් වියදම් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය.

4.5 I. ඡන්ද පොලක ඡන්ද විමසීමේ රාජකාරීවල යෙදීමට නියම කළ නිලධරයකු ඡන්ද විමසීමට පෙර දින රාත්‍රී තම ඡන්ද පොලෙහි හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී නියම කළ ස්ථානයක නතරවීමට උපදෙස් ලැබ, ඇත්ත වශයෙන්ම එම ස්ථානයේ රාත්‍රිය ගත කළේ නම්, ගමන් කළ දුර ප්‍රමාණය නො සලකා ආයතන සංග්‍රහයේ සඳහන් ගාස්තු ප්‍රමාණය අනුව සම්පූර්ණ සංයුක්ත දීමනාව ගෙවිය යුතුය.

II. ඡන්ද පොළෙහි නතර නොවූ තැනැත්තෙකුට වුවද ගමන් කළ දුර ප්‍රමාණය කිලෝමීටර් 11.2 කට/ සැතපුම් 07 ට අඩුවන අවස්ථාවක දී දුර ප්‍රමාණය නො සලකා සංයුක්ත දීමනාවෙන් අඩක් ගෙවිය හැකිය.

4.6 ඡන්ද ගණන් කිරීමේ කාර්යයන් සඳහා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක රාත්‍රී රැඳී සිටි නිලධාරීන්ට ද ගමන් කළ දුර ප්‍රමාණය නො සලකා එදිනට පමණක් සංයුක්ත දීමනා ගෙවිය හැකිය.

4.7 ඡන්ද විමසීමට පෙර දින ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ කාර්යයෙහි නියැලි නිලධාරීන්ට එම කාර්යය අවසන් කර නිවෙස් බලා යාමට කාල වේලාව ඇත. එහෙයින් එදින එම කටයුතුවල නිරත නිලධාරීන්ට සංයුක්ත දීමනා ගෙවිය හැක්කේ, එම කාර්යය සිදුකළ ස්ථානය ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානය පිහිටි නාගරික බල ප්‍රදේශයෙන් බැහැරව පිහිටියේ නම් හා එම රාජකාරීවල යෙදුන ස්ථානය සංයුක්ත දීමනා ගෙවීම සඳහා ආයතන සංග්‍රහයේ සඳහන් දුරක පිහිටා ඇත්නම් නම් පමණකි.

4.8 මැතිවරණ රාජකාරී සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා විසින් නියම කර ඇති දින හා වේලාවන්වල දී නිලධරයන් ගමන් කළ යුතුය. සංයුක්ත දීමනා ගෙවනුයේ සම්පූර්ණයෙන් ම මෙම පදනම මත වන අතර එසේ නියම කර ඇති දින වකවානුව තුළට අයත් නො වන ගෙවීම් සඳහා අදාළ වන වියදම් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

**05. විශේෂ ගමන් ගාස්තු (සැතපුම් කුලී)**

5.1 ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් නිකුත්කර ඇති මගේ අංක LAE/2025/70 හා 2025.05.04 දිනැති ප්‍රවාහන චක්‍රලේඛයේ (සියළුම ප්‍රවාහන කටයුතු සඳහා වූ සාරාංශ ගත ප්‍රවාහන චක්‍රලේඛය) සඳහන් උපදෙස් අනුව ගෙවීම් කළයුතු ය. එම උපදෙස්වලට පරිබාහිරව කටයුතු කර ඇති අවස්ථාවකදී ඒ සඳහා මාගේ විශේෂ අනුමැතිය ලබාගත යුතුය.

5.2 I. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරනලද නිශ්චිත මාණ්ඩලික නිලධාරියකුගේ පූර්ව අනුමැතිය යටතේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු තම ඡන්ද පොල වෙත ඡන්ද පෙට්ටි ආදිය රැගෙන යාම සහ ඡන්ද විමසීමෙන් පසු ඒවා ආපසු රැගෙන ඒම සඳහා තමන් විසින්ම රැගෙන ආ වාහනයක් යොදවා ගනු ලැබී නම් LAE/2025/70 හා 2025.05.04 දිනැති ප්‍රවාහන චක්‍රලේඛයේ මවිසින් සඳහන් කර ඇති කොන්දේසි හා උපදෙස්වලට යටත්ව පෙට්‍රල් වාහන සඳහා කිලෝමීටරයකට රු.52.00 ක් හා ඩීසල් වාහන සඳහා කිලෝමීටරයකට රු.47.00 බැගින් වන පරිදි පෞද්ගලික වාහනය සඳහා ගමන් ගාස්තු ගෙවිය හැකිය.

II. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා තමන් විසින් රැගෙන ආ වාහනය පැදවීමට යොදා ගන්නා ලද රජයේ සේවයේ නො වන පෞද්ගලික රියදුරුට වැටුප වශයෙන් දිනකට රු. 2000.00 බැගින් ගෙවිය හැකිය. තවද දිනකට පැය 12 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අවස්ථාවන්හි දී රු. 700.00 ක සංයුක්ත දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන වවුචරය සමඟ V-3 ආකෘතියේ (ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් රැගෙන එන පෞද්ගලික වාහන තොරතුරු ඇතුළත් කර ඇති ආකෘතිය) පිටපතක් ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික රියදුරුගේ දීමනා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රියදුරුට ගෙවා ඇති විටකදී එම මුදල ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබේ. ප්‍රතිපූර්ණය කිරීම සඳහා රියදුරු විසින් තමාට හිමි මුදල් භාරගත් බවට සහතිකයක්/ලිපියක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

III. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රැගෙන එන ලද වාහනයක් මැතිවරණ රාජකාරී සඳහා යොදාගත්තේ නම් පමණක් එවැනි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකුගේ ගමන් වියදම් ඉල්ලුම්පත හා මැතිවරණ රාජකාරීවලට අදාළ අනෙකුත් වවුචර් පැමිණීමේ සහතික ද සමඟ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

IV. ඡන්ද පොල රාජකාරි හා ඡන්ද ගණන් කිරීමේ රාජකාරී හැර වෙනත් මැතිවරණ රාජකාරි සඳහා සහභාගි වූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පෞද්ගලික වාහනයක් රැගෙනයාම වෙනුවෙන් සැතපුම් කුලිය ගෙවනු නොලැබේ.

5.3 I. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරනලද නිශ්චිත මාණ්ඩලික නිලධරයකුගේ පූර්ව අනුමැතිය යටතේ ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, ගණන් කිරීමේ සහකාර තේරීම්භාර නිලධරයකු, කොට්ඨාශ භාර සහකාර තේරීම්භාර නිලධාරියකු, විශේෂ සම්බන්ධීකරණ සහකාර තේරීම්භාර නිලධාරිවරයකු වශයෙන් පත්වීම් ලබාදී ඇති සහකාර තේරීම්භාර නිලධාරීන්ට <u>පෞද්ගලික වාහනය හෝ කලත්‍රයාගේ වාහනය</u> යොදවා ගැනීමට අවස්ථාව දී ඇත. තවද මෙම කාර්යයන් සඳහා විශේෂ හේතූන් මත අවිවාහක නිලධාරීන්ට තම පියා, මව, සොහොයුරු, සොහොයුරියන්ට අයත් වාහන ද, විවාහක නිලධාරීන්ට කලත්‍රයා, තම පියා, මව, දූ දරුවන් සතු වාහනද භාවිතා කළ හැකිය. එබැවින් එම රැගෙන එනු ලබන පෞද්ගලික වාහනය පිළිබඳ තොරතුරු V-4 ආකෘතියෙන් සනාථ කෙරෙන්නේ නම් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8.2 පරිදි ඔවුන්ට පෙට්‍රල් වාහනයක් සඳහා කිලෝමීටරයකට රු. 12.00 බැගින් ද, ඩීසල් වාහනයක් සඳහා කිලෝමීටරයකට රු. 8.00 බැගින්ද ගෙවිය හැකිය.

II. පෞද්ගලික වාහනය රැගෙන යනු ලැබූ ඉහත 5.3 I අනුඡේදයෙහි සඳහන් නිලධාරීන්ට වාහනය ධාවනය කළ දුර අනුව 5.3.1 හි සඳහන් දීමනාවට අමතරව පහත සඳහන් පරිදි විශේෂ දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ලබා ගැනීම සඳහා වාහනය භාවිතා කළ නිලධරයා විසින් පොදු 35 වවුචරයක අත්සන් කර ගමන් වියදම් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| අ. | සේවා ස්ථානය / කල්පිත රාජකාරි සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුළ | රු. 1,500.00 |
| ආ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 100 දක්වා | රු. 2,600.00 |
| ඇ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 200 දක්වා | රු. 3,400.00 |
| ඈ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 300 දක්වා | රු. 4,200.00 |
| ඉ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 400 දක්වා | රු. 5,000.00 |
| ඊ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 500 දක්වා | රු. 5,800.00 |
| උ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 600 දක්වා | රු. 6,600.00 |
| ඌ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 700 දක්වා | රු. 7,400.00 |
| එ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 700 ට වැඩි | රු. 8,200.00 |

5.4 ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, කොට්ඨාසභාර සහකාර තේරීම්භාර නිලධරයකු තම වාහනය සඳහා පෞද්ගලික රියදුරෙකු රැගෙන යාමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයාගේ උපදෙස් මත ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිලධරයකු විසින් අවසර දී ඇත්නම් එම වාහනවල පෞද්ගලික රියදුරන්ට 5.2 II සඳහන් පරිදි දීමනා ගෙවිය හැකිය. එම ගෙවීම් ලබාගැනීම සඳහා රියදුරුගේ නමින් වවුචරයක් පිළියෙල කර V-5 ආකෘතියේ (පෞද්ගලික වාහන රැගෙන එන රියදුරුගේ පැමිණීමේ සහතිකය) පිටපතක් සමඟ ඉදිරිපත් කළයුතු අතර එය රියදුරු සේවය කළ නිලධරයාගේ වවුචර් සමඟ ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික වාහන රැගෙන යන නිලධාරීන්ගේ රියදුරුට අදාළ ගෙවීම් කිසිවක් නිලධරයාගේ නමින් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ. පෞද්ගලික රියදුරුගේ දීමනා සඳහා රියදුරුගේ නමට ලියන ලද චෙක්පතකින් ගෙවීම් කළ යුතුය.

5.5 මෙලෙස පෞද්ගලික මෝටර් රථය පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවීම් කළ හැක්කේ සැතපුම් කුලී හිමි නිලධාරීන්ට පමණක් වන අතර, ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ සඳහන් සියළු නියමයන්ට හා සීමාවන්ට යටත්ව ය.

5.6 I. මැතිවරණ රාජකාරි සඳහා සේවයේ යෙදවූ වෙන් කළ වාහන සඳහා නියමිත දිස්ත්‍රික්කයට යාමට/ ඊමට අවශ්‍ය ඉන්ධන සඳහා වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම පිණිස හඳුන්වා දී ඇති AV-01 ආකෘතිය හා පොදු 35 වවුචරයක් සම්පූර්ණ කර එහි පිටුපස අත්සන් තබා අදාළ බිල්පත කොළඹ දිස්ත්‍රික්කයෙන් යන නිලධාරීන් රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙත ද වෙනත් දිස්ත්‍රික්වලින් රාජකාරි සඳහා වාර්තා කරන නිලධාරීන් තම ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා වාහනය අයත් කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය වෙත ද ඉදිරිපත් කිරීමෙන් නිලධරයා නමින් එම වියදම ප්‍රතිපූර්ණය කරවා ගත යුතුය.

II. සංචිත වාහනවලට ලබාගත් ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමට හඳුන්වා දී ඇති PV-01 ආකෘතිය සම්පූර්ණ කර රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් එම ඉන්ධන වියදම අදාළ ආයතනය නමින් ප්‍රතිපූර්ණය කරගත හැකිය.

5.7 මැතිවරණ රාජකාරී සඳහා පුද්ගලික වාහන රැගෙන යාමට/ ඒමට අවසර දී ඇති නිලධාරීන් ගමන සඳහා අධිවේගී මාර්ගය භාවිතා කළේ නම් එම ගාස්තුව ප්‍රතිපූර්ණය කරගත හැකිය. ඒ සඳහා අදාළ ප්‍රවේශ පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ගමන් වියදම් වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

## 06. රජයේ සේවයේ නොවන සේවකයින් සඳහා ගෙවීම්

6.1 ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් සේවයෙහි යොදවනු ලබන රජයේ සේවකයෙකු නොවන කාර්යාල කාර්ය සහායකයකුට ඡන්ද විමසීමට අදාළ මුළු කාර්යය සඳහා මෙහි 7.1 හි සඳහන් කාර්යාල කාර්ය සහායක දීමනාව ගෙවිය හැකිය.

6.2 එවැනි සේවකයෙකුට ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි දිනක අවම සංයුක්ත දීමනාව වූ රු. 700.00ක් බැගින් අදාළ දින ගණන සඳහා සංයුක්ත දීමනා ගෙවිය හැකිය. සේවකයකු මැතිවරණ රාජකාරී සඳහා කැටුව ගියේ නම් එම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සේවකයාට හිමි මුදල ගෙවා එම මුදල තමන්ට ප්‍රතිපූර්ණය කරගත හැකිය.

6.3 සහකාර තේරීම්භාර නිලධරයකුට ස්වකීය මැතිවරණ රාජකාරී ගමනේ දී කාර්යාල කාර්ය සහායකයකු හෝ වෙනත් අයෙකු රැගෙන යාම සඳහා අවසර දී නොමැති හෙයින් සහකාර තේරීම්භාර නිලධරයකු කැටුව යන කාර්යාල කාර්ය සහායකයින් සඳහා ගෙවීම් නො කළ යුතුය.

## 07. දීමනා

7.1 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ මැතිවරණ රාජකාරීවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | ගෙවිය යුතු දීමනාව රු. | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරී | 6,000.00 | CE 46 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (ඡන්ද පොල) | 6,000.00 | CE 19/1 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (ඡන්ද පොල) | 5,000.00 | CE 19/2 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ලිපිකරු (ඡන්ද පොල) | 3,250.00 | CE 19 |
| කාර්යාල කාර්ය සහායක (ඡන්ද පොල) | 3,000.00 | CE 19 |

* ඡන්දපොළ රාජකාරි කළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පමණක් කෙටි පණිවුඩ යැවීම වෙනුවෙන් සන්නිවේදන ගාස්තු වශයෙන් රු.100.00ක මුදලක් ඔවුන්ගේ ඡන්දපොළ දීමනාවට එකතුකර ගෙවිය යුතුය.

තවද මෙහි සඳහන් කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරීන් ඡන්ද ගණන් කිරීමේ කාර්යය සම්බන්ධීකරණය හා අධීක්ෂණය සඳහා සේවයේ නිරතව, ඇත්නම් හා CE 50 දරණ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථවන්නේ නම් 7.5 හි සඳහන් ප්‍රධාන ගණන් කිරීම් නිලධාරී/ ඡන්ද ගණන් කිරීමේ කාර්යය අධීක්ෂණ සහකාර තේරීම්භාර නිලධාරී දීමනාව ගෙවිය හැකිය.

7.2 ඡන්ද පෙට්ටි නිකුත් කිරීම සඳහා CE 47 දරන මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා ආදිය නිකුත් කිරීමේ යෙදුන නිලධාරීන්ට හා ඡන්ද පෙට්ටි ආපසු භාර ගැනීම සඳහා CE 48 දරන මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමේ දින පස්වරුවේ ඡන්ද පෙට්ටි ආදිය ආපසු භාර ගැනීමේ යෙදුනා වූ නිලධාරීන්ට එම එක් එක් දින කාර්යය සඳහා පහත සඳහන් පරිදි ගෙවීම් කළ හැකිය.

| කාර්ය මණ්ඩලය | නිකුත් කිරීම රු. | භාර ගැනීම රු. | අතිරේක දීමනාව රු. |
|---|---|---|---|
| සහකාර තේරීම්භාර නිලධාරී | 2,000.00 | 3,000.00 | 750.00 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | 1,600.00 | 2,400.00 | 400.00 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා ලිපිකරු | 1,250.00 | 1,750.00 | 350.00 |
| කණිෂ්ඨ සේවක | 1,000.00 | 1,500.00 | 300.00 |

CE 47 හෝ CE 48 දරන මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතික හැර වෙනත් ආකෘති අනුව පැමිණීමේ සහතික ඉදිරිපත් කරන නිලධාරීන්ට මෙම දීමනා නො ගෙවිය යුතුය. නිකුත් කිරීමේ කාර්යය පමණක් ඉටුකළ නිලධාරීන්ට මෙම අතිරේක දීමනාව නො ගෙවිය යුතුය. අතිරේක දීමනා ගෙවනු ලබන්නේ බඩු බාහිරාදිය මැතිවරණ නිලධාරීන්ට භාර දීමේ කටයුතු සඳහා අමතර කාලයක් වැය වූ බැවිනි.

7.3 නිලධාරියෙකුට ගෙවිය හැක්කේ 7.1 හෝ 7.2 හි සඳහන් දීමනාවන් අතුරින් එකක් පමණි. එහෙත් අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණවත් නො වීම නිසා හෝ විශේෂ අවස්ථාවක දී මෙම කාර්ය ඉටුකර ඇති නිලධරයෙකු වෙනත් කාර්යයක් ඉටුකළේ නම් ඊට අදාළ පත්වීම් ලිපිය හා පැමිණීමේ සහතිකය අනුව අදාළ ගෙවීම් කළ හැකි වුවද ඒ සඳහා නිලධරයා මැතිවරණ රාජකාරී ඉටුකළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්ගේ සහතිකයක් මත එම ගෙවීම කළ යුතුය.

7.4 ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ප්‍රකාශ/ වගුගත කිරීමේ කාර්යයන්ට පමණක් යොදවා ගනු ලබන නිලධාරීන්ට ඉහත 7.1 හෝ 7.2 හි සඳහන් දීමනා නො ගෙවිය යුතුය.

7.5 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ (ගණන් කිරීමේ නිලධාරීන් සඳහා L.A.E. 33 දරන ආකෘතියේ වූ පත්වීමකට) ඡන්ද ගණන් කිරීමේ රාජකාරීවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | දීමනාව රු. | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි/ ඡන්ද ගණන් කිරීමේ කාර්යය අධීක්ෂණ කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරි | 7,000.00 | CE 50 |
| ගණන් කිරීමේ නිලධාරි/ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | 6,000.00 | CE 54 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (තැපැල් ඡන්ද) | 6,000.00 | CE 54 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ලිපිකරු | 4,000.00 | CE 49 |
| *කාර්යාල කාර්ය සහායක | 3,000.00 | CE 49 |

*ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රැගෙන යනු ලබන සහායකයාට හෙවත් කාර්යාල කාර්ය සහායකට ගණන් කිරීම සඳහා වූ පත්වීම් ලිපිය ලෙස ඒ සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් දෙන ලද ලිපිය ප්‍රමාණවත් වන අතර එය කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරී වෙතින් අනු අත්සන් කරවා ගතයුතු වේ. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් රැගෙන යන සහායකයාට ඡන්දපොල රාජකාරි වෙනුවෙන් CE/19 ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයට වුවද දීමනාව ගෙවිය හැකිය.

එහෙත්, ඡන්ද ගණන් කිරීමේ කාර්යය සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ ගණන් කිරීමේ නිලධාරි වෙතින් ලබාදෙනු ලබන CE/49 අංක දරණ පැමිණීමේ සහතිකයද ඉදිරිපත් කළයුතුය. ඡන්ද ගණන් කිරීමේ කාර්යය සඳහා CE/19 අංක දරණ පැමිණීමේ සහතිකයට ගණන් කිරීමේ දීමනාව නො ගෙවිය යුතුය.

7.6 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශ කිරීමේ රාජකාරිවල නිරත නිලධාරීන්ට CE 55 පැමිණීමේ සහතිකයෙන් සනාථ වන්නේ නම් ඉහත 7.5 යටතේ වූ වගුවේ සඳහන් පරිදි එක් එක් නිලධරයා/ සේවකයාගේ මැතිවරණ රාජකාරියට අදාළ තනතුර අනුව ඉහත සඳහන් දීමනාව ගෙවිය හැකිය.

7.7 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිත පත්වීමක් කරනු ලැබ **CE 52** දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලයක (ඡන්ද ප්‍රදේශ මට්ටමින්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ කාර්යාලයක) සේවය කළ සහකාර තේරීම්භාර නිලධාරී/ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ ලිපිකරු හෝ කාර්යාල කාර්ය සහායක ට ගෙවනු ලබන දීමනාව ඔවුන් සේවය කරන මැතිවරණ කාර්යාලයෙන් ගෙවන ලෙස නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට විශේෂ උපදෙස් ලබාදී ඇත.

7.8 CE 53 දරන මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් ඡන්ද විමසීම හා ගණන් කිරීම සම්බන්ධිත කමිටු රාජකාරි සඳහා (ප්‍රවාහන, සුබ සාධන, පොදු පහසුකම් වැනි කමිටුවල) ඔවුන්ව පත්කර ඇති තනතුර අනුව 7.2 හා 7.5 හි සඳහන් දීමනා ඔහු සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවන ලෙස සහකාර/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරුන්ට විශේෂ උපදෙස් ලබා දී ඇත.

7.9 CE 56 දරන මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් ශාලා සම්බන්ධීකරණ කාර්ය මණ්ඩලය සඳහා දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ඔහු සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවන ලෙස සහකාර/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරුන්ට විශේෂ උපදෙස් ලබා දී ඇත.

7.10 CE 57 දරන මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් එක් එක් සභා මට්ටමින් පත්කරන ලද විශේෂ සම්බන්ධීකරණ සහකාර තේරීම්භාර නිලධාරීන්ට දීමනාවක් ගෙවිය හැකි අතර මෙම දීමනාව ඔහු සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවන ලෙස නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්ට විශේෂ උපදෙස් ලබා දී ඇත.

සැලකිය යුතුයි :-

**7.7, 7.8, 7.9** සහ **7.10** හි සඳහන් දීමනා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ගෙවීමට උපදෙස් දී ඇති බැවින් පොදු **35** වවුචරයක නිලධරයාගේ නම හා ඉටුකළ කාර්යය පිළිබඳව සඳහන් කර එහි පිටුපස අත්සන් තබා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට වවුචර් භාරදෙන ලෙස සේවයේ නියුතු නිලධාරීන්ට උපදෙස් දිය යුතුය. **CE 52, CE 53, CE 56** සහ **CE 57** ආකෘතිවල වූ පැමිණීමේ සහතිකවලට අදාළ දීමනා තම ස්ථිර සේවා ස්ථානයෙන් නො ගෙවිය යුතු අතර එවැනි ගෙවීම් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

7.11 මැතිවරණ කොමිෂන් සභාවේ/ මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් මත විශේෂයෙන් පවරන ලද මැතිවරණ රාජකාරි ඉටුකළ නිලධාරීන් සිටී නම් එවැනි තැනැත්තන්ට ගෙවිය යුතු දීමනා සඳහා අදාළ වවුචර් එම විශේෂ රාජකාරි ඉටුකළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දී ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස ඔබගේ නිලධාරීන්ට උපදෙස් දිය යුතුය.

7.12 රජයේ සේවයේ නියුතු රියදුරන්ට හැර ඉහත සඳහන් 7.1, 7.2, 7.5 හා 7.7 අනු ඡේද යටතේ සඳහන් දීමනා ලබා ගන්නා නිලධාරීන්ට හා සේවකයන්ට එම කාලසීමාව සඳහා අතිකාල හෝ නිවාඩු දින වැටුප් නො ගෙවිය යුතුය.

## 08. රජයේ වාහනවල රියදුරන්ට ගෙවීම්

8.1 මැතිවරණ කොමිෂන් සභාවේ හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයාගේ ඉල්ලීම පරිදි මැයි මස 03 වෙනි දින සිට මැයි මස 09 දින දක්වා (එම දෙදින ද ඇතුළත්ව) කාල සීමාව තුළ පමණක් ඡන්ද විමසීමට අදාළ රාජකාරීවල යොදවන ලද වාහනවල රියදුරන්ට CE 51 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ වන්නේ නම් රජයේ කාර්යාල/ ආයතනවල ස්ථිර සේවයේ නිරත රියදුරන්ගේ අතිකාල, ගමන් වියදම් හා සංයුක්ත දීමනා ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවිය යුතු අතර, රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙතින් එම ගෙවීම් ප්‍රතිපූර්ණය කරවා ගත යුතුය.

8.2 එසේ වුවද මැතිවරණ රාජකාරීවලට අදාළව සේවයේ යෙදුන පහත සඳහන් රියදුරන්ගේ ගෙවීම් සඳහා වූ වවුචර් ඔවුන් සේවය කළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

I. මැයි මස 03 වෙනි දින සිට මැයි මස 09 දින දක්වා වූ දින 07ක කාලසීමාවෙන් බැහැර වූ දිනයන්හි දී මැතිවරණ කටයුතුවලට අදාළව සේවයේ නිරතව ඇති රියදුරන්ගේ ගෙවීම්.

II. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි රියදුරන් හා එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් රජයේ කාර්යාලවල රියදුරන්ගේ ගෙවීම්.

III. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි රියදුරන් හා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් කාර්යාලවල රියදුරන්ගේ ගෙවීම්.

**ඉහත 8.2 අනුඡේදය යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත්වන රියදුරන් සඳහා තම ස්ථිර සේවා ස්ථානවලින් ගෙවීම් නො කළයුතු අතර එවැනි ගෙවීම් ප්‍රතිපූර්ණය සඳහා කරන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

8.3 මැතිවරණ දිනවල වුව ආරක්ෂක අවශ්‍යතාව සඳහා සේවයේ යොදවන ලද නිලධාරීන්ගේ දීමනා සහ පොලිස් ස්ථානවල සේවයේ යොදවන ලද වාහනවල රියදුරන්ට දීමනා, අතිකාල හා ගමන් වියදම් ගෙවීම ආරක්ෂක අමාත්‍යාංශය හා පොලිස් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ප්‍රතිපාදනවලින් එම ආයතන විසින් ගෙවනු ලබන හෙයින් එවැනි ගෙවීම් ඔබ විසින් සිදු නොකළ යුතුය.

8.4 මැතිවරණ රාජකාරිවල යෙදවූ රියදුරු මහතුන් සඳහා පොරොත්තු සේවා වෙනුවෙන් අතිකාල ගෙවිය යුත්තේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 6.2 උප වගන්තිය අනුවය.

**09. මැතිවරණ උපදෙස් පන්තිවලට සහභාගිවීම සඳහා ගෙවීම්**

9.1 නිලධාරීන්ට වියදමක් නොමැතිව සහභාගීවීමට හැකි වන පරිදි උපදෙස් පන්ති පැවැත්වීමට සියළු උත්සාහයන් ගෙන ඇත. කෙසේ වුවද, උපදෙස් පන්තිවලට සහභාගිවීම සඳහා දරණ ලද ගමන් වියදම් ලබා ගැනීමට අපේක්ෂා කරන නිලධාරීන් ඒ සඳහා තම ගමන් වියදම් වවුචර් උපදෙස් පන්ති සඳහා කැඳවීම් සිදුකළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. උපදෙස් පන්ති පවත්වනු ලැබුවේ රාජගිරිය මැතිවරණ කොමිෂන් සභාවේ කැඳවීම මත නම් ඒ සඳහා වූ ගමන් වියදම් වවුචර් රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත ඉදිරිපත් කළ යුතුය.

9.2 උපදෙස් පන්තිවලට යාම සඳහා කුලී මෝටර් රිය ගාස්තු හෝ ඉල්ලා ගත් වාහනවලට ගමන් ගාස්තු/ සැතපුම් කුලී ගෙවනු නො ලැබේ. තම පෞද්ගලික/ කලත්‍රයාගේ වාහනය ඒ සඳහා භාවිතා කළ බව උපදෙස් පන්ති පැවැත්වීම සඳහා කැඳවීම් කළ මාණ්ඩලික නිලධරයා විසින් නිකුත් කළ විධිමත් සහතිකයකින් සනාථ කළහොත් පමණක් පෞද්ගලික වාහනය සඳහා ගමන් ගාස්තු/ සැතපුම් කුලී ගෙවිය හැකිය.

9.3 උපදෙස් පන්තිවලට සහභාගි වූ නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා මුදල් වෙන්කර දෙන ලෙස ආයතන ප්‍රධානීන් විසින් ඉල්ලීම් නො කළ යුතුය. තවද උපදෙස් පන්ති සඳහා සහභාගි වූවන්ට තම ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවීම් කර එම මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලීම් නො කළ යුතුය.

9.4 උපදෙස් පන්තිවලට සහභාගිවීම වෙනුවෙන් ගමන් වියදම් හා සංයුක්ත දීමනා හැර නිවාඩු දින වැටුප්, අතිකාල හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නො ලැබේ.

**10. තම ස්ථිර සේවා ස්ථානයෙන් සිදුකරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට ප්‍රතිපාදන ලබා ගැනීමට ඉදිරිපත් කළයුතු උපලේඛන**

10.1 මෙම චක්‍රලේඛය අනුව තම ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවීම් කළ නිලධාරීන්ගේ විස්තර (රියදුරන්ගේ හැර) අමුණා ඇති "ඒ ආකෘතිය" අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ කොමිෂන් සභාව වෙත එවීමෙන් එම මුදල ප්‍රතිපූර්ණය කරගැනීමට හැකිය.

10.2 මෙහි 8.1 අනුඡේදය යටතේ රජයේ වාහනවල රියදුරන්ට අතිකාල, ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීම් පිළිබඳ විස්තර අමුණා ඇති "බී ආකෘතිය" අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ කොමිෂන් සභාව වෙත එවීමෙන් එම ගෙවීම් ප්‍රතිපූර්ණ කර ගැනීමට හැකිය.

10.3 ඉහත කී උපලේඛන සමඟ <u>ගෙවීම් වවුචර්වල මුල් පිටපත් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකළ යුතුය. එම වවුචර් ගෙවීම් කළ ආයතනයේ විගණන අවශ්‍යතාව සඳහා තබාගත යුතුය</u>.

10.4 ගෙවීම් උපලේඛන පමණක් මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතර ද්විත්ව ගෙවීම් වැළැක්වීම සඳහා එක් උපලේඛනයකට ඇතුලත් කළ නම් නැවත නැවතත් ඇතුළත් නොකළ යුතුය. තවද ෆැක්ස් මඟින් එවන උපලේඛනවලට ගෙවීම් කරනු නො ලැබේ.

10.5 මේ සමඟ අමුණා ඇති "ඒ" හා "බී" ආදර්ශ ආකෘතිපත් අනුව අපේක්ෂිත තොරතුරු සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත්කළ යුතුය. එසේම නිලධාරීන්ට ගෙවනු ලබන විවිධ දීමනා වෙන් වෙන් වශයෙන් නිවැරදිව අදාළ තීරුවල ඇතුළත් කළ යුතුය. අසම්පූර්ණ හෝ සදොස් තොරතුරු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවලදී විමසීම් කිරීමට හා නිවැරදි තොරතුරු සොයා බැලීමට සිදුවන හෙයින් එවැනි ගෙවීම් ප්‍රමාද වනු ඇත.

## 11. ප්‍රතිපූර්ණය කිරීමට හෝ ප්‍රතිපාදන ලබාදීමට අදාළ උපලේඛන සකස් කිරීම

11.1 ඡන්ද ගණන් කිරීමේ කාර්ය අධීක්ෂණය කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරි, ගණන් කිරීමේ නිලධාරි, කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරි, ඡන්ද පෙට්ටි නිකුත් කිරීම, භාර ගැනීම, ප්‍රතිඵල සැකසුම් මධ්‍යස්ථානයේ සහකාර තේරීම්භාර නිලධාරි, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, ලිපිකරු හා කාර්යාල කාර්ය සහායක වශයෙන් මැතිවරණ රාජකාරිය, අමුණා ඇති "ඒ ආකෘතිය" යටතේ නිවැරදිව සටහන් කළ යුතුය.

11.2 ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින් ඡන්ද පොල කටයුතු සඳහා කාර්යාල කාර්ය සහායකයකු වශයෙන් රජයේ සේවයේ නො වන අයකු සේවයේ යොදා ගෙන ඇති අවස්ථාවකදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා නමින් ම එම කාර්යාල කාර්ය සහායකගේ ගමන් වියදම්, සංයුක්ත දීමනා හා ඡන්ද පොල දීමනා ලබා ගත්තේ නම් එම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නම ඉදිරියෙන් කාර්යාල කාර්ය සහායකගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා පිළිබඳව "ඒ" ආකෘතියේ 12 වන තීරුවේ ඇතුලත් කර මැතිවරණ කාර්යය වෙනුවෙන් වූ දීමනාව පමණක් 13 වන තීරුවේ ද දැක්විය යුතුය.

11.3 තම නිත්‍ය රාජකාරි සඳහා වාහනයක් (Assigned Vehicle) වෙන්කර ඇති නිලධරයකු මැතිවරණ රජකාරි සඳහා එම වාහනය රැගෙන ගොස් ඇති අවස්ථාවක දී එම වාහනය පැද වූ රජයේ සේවයේ රියදුරුට කරන ලද ගෙවීම් "බී" ආකෘතියෙහි සඳහන් කළ යුතු අතර එම රියදුරුගේ නම ඉදිරියෙන් 5 වන තීරුවේ වාහනය මැතිවරණ රාජකාරි සඳහා රැගෙන ගිය මාණ්ඩලික නිලධරයාගේ නම සඳහන් කළ යුතුය. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි වෙත වාර්තා කළ සංචිත වාහනයක් (Pool Vehicle) නම් 5 වෙනි තීරුව හිස්ව තැබිය යුතුය.

**සැලකිය යුතුයි - මෙම චක්‍රලේඛයේ අමුණා ඇති "ඒ" හා "බී" ආකෘති පත්‍ර මඟින් ඉල්ලා ඇති තොරතුරු සියල්ල නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ගෙවීම් සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුතු අතර අසම්පූර්ණ හෝ මෙම චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති ආකෘති පත්‍රයන්ගෙන් බැහැර වෙනත් ආකෘතිපත්‍ර සඳහා ගෙවීම් කරනු නොලබන බවද සලකන්න.**

## 12. වෙනත් කරුණු

12.1 සියළුම නිලධාරීන්ගේ ගමන් වියදම්, අතිකාල හා දීමනා ඡන්ද විමසීමේ දින සිට දින 60ක් ඇතුලත ගෙවා අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

12.2 ගෙවීම් උපලේඛන මෙම කාර්යාලයට එවීමට පෙර එමඟින් ඉල්ලා ඇති සියළු විස්තර නිවැරදිව ඇතුළත්ව තිබේදැයි යන්න පරීක්ෂා කර බලන ලෙස ද, ගෙවිය යුතු මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර යතුරු ලිවීමෙන් පසු නැවත එකතු කර බලන ලෙස ද ඉල්ලා සිටින අතර එම ආකෘතිපත් පිටු කිහිපයකින් සමන්විත වන්නේ නම් සෑම පිටුවකම අගට උප එකතුව හා සියළුම පිටුවල උප එකතුන් අවසාන පිටුවේ අගට මුළු එකතුව ලෙස යෙදිය යුතුය. එසේම ආදර්ශ ආකෘතියේ පරිදි නිලධාරීන් සංඛ්‍යාව ගණනය කර ගැනීම සඳහා නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් අනු අංකය සඳහන් කළ යුතුය.

12.3 මෙම චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් පරිදි මැතිවරණ රාජකාරිවල නිරත වූ කාර්ය මණ්ඩලයට හිමි දීමනා ලබාගැනීම සඳහා වවුචර් සකස් කර කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ඔබගේ නිලධාරීන් හා සේවක මහතුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

12.4 දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් සිදුකරන ගෙවීම් ඡන්ද විමසීම අවසන් වී දින 30ක් තුළ හෝ ඊට පෙර මෙම ඡන්ද විමසීමට අදාළ ගෙවීම් අවසන් කළයුතුය.

12.5 ප්‍රතිපූර්ණය කිරීම/ ප්‍රතිපාදන වෙන් කිරීම පිණිස කෙරෙන ඉල්ලීම් කඩිනමින් මා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ඉල්ලීම් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට නො යැවිය යුතුය.

12.6 ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන උපලේඛන (AV-01 සහ PV-01 ආකෘති) පරීක්ෂා කිරීමේ කටයුතු මෙම කොමිෂන් සභාවේ ප්‍රවාහන අංශයෙන් සිදු කෙරේ. එහෙයින් ප්‍රවාහන අංශය භාර මාණ්ඩලික නිලධරයා [නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන)] අමතා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිය.

12.7 මෙම ඡන්ද විමසීම සඳහා අදාළ ගෙවීම් 2025.07.07 වන දින හෝ ඊට පෙර අවසන් කිරීමට නියමිත බැවින් එදිනට පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් මෙන්ම විමසීම් ද ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

12.8 ඉහත කී දිනට පෙර උපලේඛන ඉදිරිපත් කර ප්‍රතිපූර්ණය කර නො ගන්නා ගෙවීම් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ගෙවීම් කළ නිලධරයා වෙත පැවරෙන බවත්, නියමිත දිනට ප්‍රතිපූර්ණය කර නො ගන්නා ගෙවීම් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වගකීම භාර නො ගන්නා බව කාරුණිකව දන්වමි.

12.9 මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් පහත දුරකථන අංක වෙත ඇමතීමෙන් එම තොරතුරු දැනගත හැකිය.

| | |
|---|---|
| ප්‍රධාන මූල්‍ය නිලධාරි | - 0703902610 |
| ප්‍රධාන ගණකාධිකාරි | - 0112866521 |
| ගණකාධිකාරි (ගෙවීම්) | - 0112886805 |

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත් :- 1. විගණකාධිපති - දැන ගැනීම පිණිස
2. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව - කොමිෂන් සභාව දැනුවත් කිරීම සඳහා
2. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - අක්මුදල් නිදහස් කිරීම සඳහා
3. පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - අක්මුදල් නිදහස් කිරීම සඳහා
4. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැන ගැනීම පිණිස
5. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් - දැන ගැනීම පිණිස

D:\Hansi\1. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම\CFO Sir\2025\චක්‍රලේඛ\2025.04.08 - 1 76.docx

"ඒ ආකෘතිය"

මැතිවරණ කොමසාරිස් ජනරාල්,

දිනය:-

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

## මැතිවරණ රාජකාරී සඳහා සේවයේ යොදවන ලද නිලධාරීන්ගේ ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම

ආයතනයේ නම :

ආයතනය : මධ්‍යම රජය/ පළාත් සභා සතු ආයතන/ ව්‍යවස්ථාපිත ආයතන/ වෙනත් (නොගැලපෙන වචන කපා හරින්න)

ආයතනයේ ලිපිනය :

දුරකථන අංකය :

ගෙවූ මුළු මුදල (රු.) :

** ඔබ විසින් ගෙවා ඇති මුදල Sri Lanka Interbank Payment System (SLIPS) මඟින් ඔබගේ නිල බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කරන බැවින් බැංකු ගිණුම පිළිබඳ පහත තොරතුරු ලබාදීම අනිවාර්ය වේ.

බැංකු ගිණුමේ නිලනාමය (ඉංග්‍රීසියෙන්) :

ගිණුම අයත් බැංකුවේ නම :

බැංකු ශාඛාවේ නම :

නිල බැංකු ගිණුම පවත්නා බැංකුවේ කේත අංකය : ☐☐☐☐

නිල බැංකු ගිණුම පවත්නා බැංකු ශාඛාවේ කේත අංකය : ☐☐☐

නිල බැංකු ගිණුම් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

| අනු අංකය | (01) | (02) | (03) | (04) | (05) * | (06) | (07) | (08) | මැතිවරණ දීමනා (09) | (10) | (11) | නිලධරයා කැවුව යන රජයේ සේවයේ නොවන රියදුරු / කා.කා.ස. (12) | (13) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිලධරයාගේ නම | ස්ථිර තනතුර | ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | මැතිවරණ රාජකාරි කටයුතු කළ තනතුර | ස්ථිර හෝ කල්පිත සේවා ස්ථානය සිට මැතිවරණ රාජකාරි සඳහා සේවයේ යොදවන ස්ථානය දක්වා ගමන යාමට (එක් දිශාවකට) ඇති කෙටි දුර ප්‍රමාණය (km) | සංයුක්ත දීමනාව ගෙවිය යුතු දින ගණන | ගමන් වියදම්/ සැතපුම් කුලිය | සංයුක්ත දීමනාව | ඡන්ද පොළ කටයුතු | ගණන් කිරීම | නිකුත් කිරීම හා භාර ගැනීම | කා.කා.ස./ රියදුරු ගමන් වියදම හා සංයුක්ත දීමනාව | කා.කා.ස./ රියදුරු දීමනාව |
| | | | | | | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 1. | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | |

(05) * නිලධරයා තමන් පදිංචි නිවසෙහි සිට ගමන ආරම්භ කරන්නේ නම් හා එම නිවස ඔහුගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 24 ක් ඇතුළත පිහිටා ඇත්නම් එකී නිවස ඔහුගේ කල්පිත රාජකාරී සේවා ස්ථානය සේ සලකා ගෙවීම් කළ හැකිය. එසේ නැතිනම් ගමන ආරම්භ කරන ස්ථානය ලෙස සැලකිය යුත්තේ නිලධරයාගේ ස්ථිර සේවා ස්ථානයයි. *ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු කැවුව යන රජයේ සේවකයකු නොවන සහායකයකුගේ කල්පිත සේවා ස්ථානය ලෙස සැලකිය යුත්තේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ස්ථිර සේවා ස්ථානයයි.

සකස් කළේ :-

අත්සන :

නම :

තනතුර :

ජංගම දුරකථන අංකය :

පරීක්ෂා කළේ :-

අත්සන :

නම :

තනතුර :

ජංගම දුරකථන අංකය :

ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

..........................................................

ආයතන ප්‍රධානී/ ප්‍රධාන මුල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරී

නම :

තනතුර :

නිල මුද්‍රාව :

"බී ආකෘතිය"

මැතිවරණ කොමසාරිස් ජනරාල්,

දිනය:-

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

<u>මැතිවරණ රාජකාරි සඳහා සේවයේ යොදවන ලද රජයේ සේවයේ නියුක්ත රියදුරන්ගේ ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම</u>

ආයතනයේ නම :

ආයතනය : මධ්‍යම රජය/ පළාත් සභා/ ව්‍යවස්ථාපිත ආයතන/ වෙනත් (නොගැලපෙන වචන කපා හරින්න)

ආයතනයේ ලිපිනය :

දුරකථන අංකය :

ගෙවූ මුළු මුදල (රු.) :

** ඔබ විසින් ගෙවා ඇති මුදල Sri Lanka Interbank Payment System (SLIPS) මඟින් ඔබගේ නිල බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කරන බැවින් බැංකු ගිණුම පිළිබඳ පහත තොරතුරු ලබාදීම අනිවාර්ය වේ.

බැංකු ගිණුමේ නිලනාමය (ඉංග්‍රීසියෙන්) :

ගිණුම අයත් බැංකුවේ නම :

බැංකු ශාඛාවේ නම :

නිල බැංකු ගිණුම පවත්නා බැංකුවේ කේත අංකය : ☐☐☐☐

නිල බැංකු ගිණුම පවත්නා බැංකු ශාඛාවේ කේත අංකය : ☐☐☐

නිල බැංකු ගිණුම් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

| | (01) | (02) | (03) | (04) | (05) | (06) | (07)* | (08) | (09)* | (10) | | (11) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | රියදුරුගේ නම | මූලික වැටුප (Basic Salary) | වාහනයේ අංකය | වාහනය වෙන්කළ/ සංචිතයේද යන වග | නිලධරයකුට වෙන්කළ වාහනයක් නම් එම නිලධරයාගේ නම | ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | ස්ථිර සේවා ස්ථානය සිට මැතිවරණ රාජකාරි සඳහා සේවයට වාර්තා කල ස්ථානය දක්වා <u>ගමන යාමට</u> <u>(එක් දිශාවකට)</u> ඇති <u>කෙටි දුර</u> ප්‍රමාණය (km) | සංයුක්ත දීමනාව ගෙවූ දින ගණන | අතිකාල පැය ගණන | ගමන් වියදම් හා සංයුක්ත දීමනාව | | අතිකාල හා නිවාඩු දින වැටුප් | |
| | | | | | | | | | | රු. | ශත | රු. | ශත |
| 1. | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | |

(09) * අතිකාල පැය ගණනය කිරීමේදී රියදුරු පැමිණීමේ සහතිකය වන <u>CE 51</u> හි සඳහන් පැය ගණන ද සේවයෙන් මුදාහරින වේලාව සිට ස්ථිර සේවා ස්ථානය දක්වා නැවත පැමිණීම සඳහා ගතවන කාලය ද (දුර ප්‍රමාණය (Km) අනුව) සැලකිල්ලට ගතයුතුය. <u>CE 51</u> හි වෙනසක් සිදු කොට ඇත්නම් එහි නිරවද්‍යතාව අදාළ සහකාර පේ‍්‍රමිහාර නිලධාරී (ප්‍රවාහන) මඟින් තහවුරු කර ගත යුතුය. තවද වැඩකරන දිනයකදී රාජකාරි පැය ගණන වන පැය 09 සේවා කාලය තම සේවය සඳහා පැමිණි වේලාවෙන් (ධාවන සටහන් අනුව) අඩුකර ගෙවීම් කටයුතු සිදු කල යුතුය.

සකස් කළේ :

අත්සන :

නම :

තනතුර :

ජංගම දුරකථන අංකය :

පරීක්ෂා කළේ :

අත්සන හා දිනය :

නම :

තනතුර :

ජංගම දුරකථන අංකය :

ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.....................................................................

ආයතන ප්‍රධානී/ ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරී

නම :

තනතුර :

නිල මුද්‍රාව :